# සංක්ෂිප්ත එකතුව

# 2021

**(සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ පර්යේෂණ නිබන්ධන සාරාංශ එකතුව)**


**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය**

தேசிய கூட்டுறவு அபிவிருத்தி நிறுவகம்

**NATIONAL INSTITUTE OF CO-OPERATIVE DEVELOPMENT**

Member of the International Co-operative Alliance

සංක්ෂිප්ත එකතුව -2021

**© සියළු හිමිකම් ඇවිරිණි.**

පූර්ව අවසරයකින් තොරව මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීම, එසේ අවසරයකින් තොරව මුද්‍රණය කරන ලද පිටපත් අලෙවි කිරීම,හුවමාරු කිරීම හෝ එවැනි කිසිම ආකාරයකින් භාවිතයේ යෙදීම සපුරා තහනම් වෙයි.

**සංස්කරණය**

දිනුෂ දිසානායක

**පරිගණක වදන් සැකසීම හා පිටු සැලසුම**

එච්.පි.ඩී.ගුණවර්ධන

**පිටකවරය නිර්මාණය**

ප්‍රියන්ත නාරම්පනාව

මුද්‍රණය හා ප්‍රකාශනය
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල.

# පටුන

පෙරවදන ........................................................................................................ 1
වෙන්කොට හදුනාගතහැකි තරඟකාරී උපක්‍රමයන් තිරසාර සංවිධාන කාර්ය සාධනය සඳහා වන බලපෑම ........................................................................................................ 2
කාන්තාව සවිබල ගැන්වීම සඳහා ග්‍රාමීය බැංකුවල දායකත්වය ..................................... 4
සමුපකාර සමිතියක සාර්ථකත්වයට පාරිභෝගික තෘප්තියේ ඇති බලපෑම පිළිබඳ අධ්‍යානය ........................................................................................................ 5
විවිධ සේවා සමුපකාර සමිති පාරිභෝගික අංශයේ සාර්ථකත්වය උදෙසා අලෙවි උපක්‍රම වල ප්‍රමාණාත්මකභාවය ( සී/ස ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය ආශ්‍රිත සිද්ධි අධ්‍යයනය) ........................................................................ 6
සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය සඳහා පුහුණු මානව සම්පත මඟින් සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය ........................................................................ 7
විවිධ සේවා සමුපකාර සමිතියක භෞතික හා මානව සම්පත් උපයෝජනය. (සි/ස නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින් ) .................................................... 9
සේවක ප්‍රතිලාභ සේවක තෘප්තියට බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය : පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල වෙළඳසැල් කළමනාකරුවන් ආශ්‍රයෙන් කරනු ලබන පර්යේෂණය ............................................ 10
ග්‍රාමීය ණය අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකුවල ප්‍රමාණාත්මක දායකත්වය පිළිබඳ අධ්‍යානය ........................................................................ 11
සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ණය නිකුත් කිරිමේ ක්‍රියාවලිය ණය අකාර්යවීම කෙරෙහි සිදු කරනු ලබන බලපෑම ........................................................................ 12
සංවිධානවල සේවක ප්‍රතිලාභ ක්‍රමවේදය සේවක රැකියා කැපවිමට බලපානු ලබන ආකාරය : මධ්‍යම පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන් ඇසුරින් ........................................................................ 14
ආයතනික සාමාජීය වගකීම හා පාරිභෝගික තෘප්තිය සී/ස පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරෙන් කරනු ලබන අධ්‍යානය .................................................... 15
බඳවාගැනීම්, උසස් කිරීම් සහ සංචේතන පටිපාටිය සමුපකාර සේවක පිරිවැටුම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යානය ........................................................................ 16
පාරිභෝගික අංශ පාඩු ලැබීමට පාදක කළමනාකරණ හේතු පිළිබඳ පර්යේෂණාත්මක සිද්ධි අධ්‍යානය ........................................................................ 17

පෙරවදන

සමුපකාර ව්‍යාපාරය යනු තම සාමාජික අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරිමට ලොව බිහි වූ විශිෂ්ඨතම ව්‍යවසායක ආකෘතියයි. සමුපකාර ක්ෂේත්‍රයේ ඉදිරි සංවර්ධනය හා පැවැත්ම උදෙසා පර්යේෂණ සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරනු ලබයි. පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ගැටළු විසඳමින් දැනුම වර්ධනයට දායක වීමයි. එමෙන්ම, පර්යේෂණ මඟින් විශේෂිත විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගනිමින් ගැටලු විශ්ලේෂණය කර තිරසාර විසඳුම් සෙවීමට උත්සහ කරනු ලබයි. සමුපකාර දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු සමුපකාර සංවර්ධන නිළධාරින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මඟපෙන්වීම මත තම තුන් වන කාර්යක්ෂමතා කඩඉම සඳහා සමුපකාර ක්ෂේත්‍රයේ තෝරා ගත් කාලින මාතෘකාවක් යටතේ වචන 5000 කට නොඅඩු ස්වාධීන පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතු වේ. එකී නිළධාරින් විසින් සිදු කරනු ලැබූ පර්යේෂණ පරිශීලකයන්ගේ භාවිතය උදෙසා සංක්ෂිප්ත එකතුවක් ලෙස මෙසේ එළිදක්වනු ලබයි. සමුපකාර ව්‍යාපාරය තුල නවමානයන් සොයා යෑම සඳහා උක්ත පර්යේෂණ නිබන්ධන වල සාරාංශ පරිශීලකයන්ට යොදාගත හැක. තවදුරටත් සඳහන් කිරිමේදී ගැටළු විසඳීමට සහ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සහ දැනුම පර්යේෂණ මඟින් පරිශීලකයන්ට සපයනු ලබයි. එමෙන්ම, කාර්යක්ෂමතා කඩඉම සපුරාලීමට එහා යමින් සමුපකාර ක්ෂේත්‍රයට ගුණාත්මක බවින් යුතු පර්යේෂණ දායාද කිරිම පිළිබඳව සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරින් හට මාගේ ගෞරවය හා ස්තූතිය පුද කරමි. සමුපකාර ක්ෂේත්‍රය තුල අඛණ්ඩව පර්යේෂණ සිදුකිරිම තුල සමුපකාර ව්‍යාපාරය කාලීන වශයෙන් නිවැරදිව ගමන් කරනු ඇත. වෙළඳපල තත්වයන්ට ගැලපෙන අයුරින් නව්‍යතා බිහිකරමින් පෞද්ගලික අංශය හා තරඟකාරීව සමුපකාර ව්‍යාපාරය මෙහෙයවිය යුතුව ඇත. එකී අරමුණ පෙරදැරිව, දැනුම සඳහා සැබෑ දායකත්වයක් ලබා දෙන මෙවලමක් ලෙස 2021 වර්ෂයේ සංක්ෂිප්ත එකතුව ඔබ හට දායාද කරන්නෙමු.

දිනුෂ දිසානායක,
සංස්කාරක,
සංක්ෂිප්ත එකතුව - 2021

## වෙන්කොට හඳුනාගතහැකි තරඟකාරි උපක්‍රමයන් තිරසාර සංවිධාන කාර්ය සාධනය සඳහා වන බලපෑම

### (සී/ස දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතියේ බීජ වී ගොවීන් ඇසුරෙන් කරනු ලබන අධ්‍යයනය)

මිතිලා ජයන්ති අළුදෙණිය[1]
ශානිකා මුදන්නායක[2]

1. *සමුපකාර සංවර්ධන නිලධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, කඳුරුවෙල.*
2. *කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*

වී ගොවිතැන යනු ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කර්මාන්ත වලින් එකකි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවතින දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතිය අතීතයේදී ඉතා දියුණු මට්ටමක පැවති අතර, වර්තමානයේදී යම්කිසි පසුබෑමකට ලක්ව ඇත. මෙම අධ්‍යනය මඟින් පර්යේෂකයා සී/ස දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතියේ බීජ වී ගොවීන් පිළිබඳව වෙන්කොට හඳුනාගතහැකි තරඟකාරි උපක්‍රමයන් තිරසාර සංවිධාන කාර්යසාධනය සඳහා වන බලපෑම පිළිබඳව හෙළිදරව්වක් සිදුකර ඇත. ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතා කරමින් සී/ස දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතියේ බීජ වී ගොවීන් 35 දෙනෙකු නියැඳිය ලෙස භාවිතා කරමින් ප්‍රශ්ණාවලියක් සකස්කර දිඹුලාගල හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අනුබද්ධව විසිරී සිටින බීජ වී ගොවීන්ගෙන් තොරතුරු රැස්කර සංඛ්‍යාන දත්ත මඟින් විශ්ලේෂණය සිදු කරන ලදි. මෙහිදී, ලිකර්ට් පරිමාණ (Likert Scale) මත SPSS මෘදුකාංගය භාවිතා කර දත්ත විශ්ලේෂණය කර ඇත. ප්‍රස්ථාර, වගු මඟින් දත්ත පැහැදිලි කර ඇත. දත්ත විශ්ලේෂණයට අනුව නියැඳියෙන් 45.7% ක ප්‍රමාණයක් වයස අවුරුදු 41-60 කාණ්ඩයේ සිටින අතර බීජ නිෂ්පාදනය කරන්නන්ගෙන් බහුතරය එම වයස් කාණ්ඩයට අයත් වේ. තවදුරටත්, මුළු නියැඳියෙන් 71.4% පුරුෂ කාණ්ඩයට අයත් වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගත්කල දිඹුලාගලින් 80% සහ වැලිකන්දෙන් 20% ක් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇත. ඉහත බීජ ගොවීන් බීජ වී ව්‍යාපෘතියේ නියුතු වසර ගණන සලකා බලන විට නියැඳියෙන් වැඩිම ප්‍රමාණයක් වසර 11-20 ත් අතර ප්‍රමාණයේ සිටි. එය සමස්ථ නියැඳියෙන් 45.7% ක ප්‍රමාණයකි. වී ගොවීන් කුඹුරු වගාකරන අක්කර ගණන සලකා බලන විට වැඩිම ගොවීන් පිරිසක් සිටින්නේ අක්කර 03 ක් වගාකරන අයවළුන්ය. එය සමස්ථ නියැඳියෙන් 48.6% ක ප්‍රමාණයකි. පර්යේෂණ සාහිත්‍යයේ න්‍යායික සංකල්පවලට අනුව පර්යේෂකයා පර්යේෂණයේ සංකල්පීය රාමුව ගොඩනඟන ලදි. ඒ අනුව ස්වායත්ත විචල්‍යයන් තුනකින් සහ එක් පරායත්ත විචල්‍යයකින් සංකල්පීය රාමුව සමන්විත වේ. නවෝත්පාදන කළමනාකරණය, ඉලක්කගත වීම හා තරඟකාරි උපක්‍රම භාවිතය ස්වායත්ත විචල්‍යයන් වන අතර, පරායත්ත විචල්‍යය වූයේ සංවිධානයේ කාර්යසාධනයයි. සංවිධානයේ කාර්යසාධනය

සඳහා නවෝත්පාදන කළමනාකරණය අවශ්‍ය වේ. ($H_1$), සංවිධානයේ කාර්යසාධනය සඳහා ඉලක්කගත විම අවශ්‍ය වේ. ($H_2$), හා සංවිධානයේ කාර්යසාධනය සඳහා තරඟකාරි උපක්‍රම අවශ්‍ය වේ. ($H_3$), ලෙස පර්යේෂණයේ කල්පිත ගොඩනඟන ලදි. දත්තවල විශ්වාසනීය බව (Reliability), Cronbach alpha සංගුණය මඟින් ගණනය කරන ලද අතර එය 0.748 ලෙස ලැබුණු අතර දත්ත විශ්වාසනීය බවකින් යුක්ත බව එමඟින් තහවුරු විය. විචල්‍යයන් අතර සහසම්බන්ධය පියර්සන් සහසම්බන්ධය මඟින් පරික්ෂා කරන ලදි. එහිදී, නවෝපාදන කළමනාකරණය හා සංවිධානයේ කාර්යසාධනය 0.748 ක ධණ සම්බන්ධතාවයක් ද, ඉලක්කගත වීම හා සංවිධානයේ කාර්යසාධනය 0.592 ක ධන සම්බන්ධතාවයක්ද, තරඟකාරි උපක්‍රම භාවිතය හා සංවිධානයේ කාර්යසාධනය 0.382 ක ධන සම්බන්ධයක් ද පවතින බව අනාවරණය විය. කල්පිත හා උප න්‍යාස සියල්ල ධනාත්මක ලෙස ඉහත ගණිතමය මිණුම් වලින් සාධනය වී තිබේ. ඒ අනුව, අධ්‍යනයේ අවසාන ප්‍රතිඵලය ලෙස නවෝත්පාදන කළමනාකරණය, ඉලක්කකගත විම හා තරඟකාරි උපක්‍රම භාවිතය සංවිධානයේ කාර්යසාධනය සඳහා ප්‍රමාණවත් සම්බන්ධතාවයක් දක්වන බව ඔප්පු වී ඇත. තවදුරටත්, නවෝත්පාදන බිහි කරමින් බීජ ගොවීන් දිරිමත් කිරීමටත්, වෙළඳපල ඉලක්ක කර පාරිභෝගිකයා, තරඟකරුවන් හා ආයතන අතර සම්බන්ධතාවය හොඳින් පවත්වාගෙන යාමට ආයතනික කළමනාකාරිත්වය උනන්දු විය යුතු බවත්, බීජ වී ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා විවිධ වු ව්‍යාපාරික උපක්‍රම හඳුනාගෙන ඒ අනුව තම වෙළඳපල කොටස තහවුරු කර ගැනිමටත් පර්යේෂකයා යෝජනා කරයි. අනාගත පර්යේෂණ සඳහා පර්යේෂකයා, බීජ වී ගොවීන් පිළිබඳ පර්යේෂණ ඉදිරියට සිදු කිරිමටත්, මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිභෝගිකයින්, තරඟකරුවන් මෙන්ම ආයතනයේ කළමනාකාරිත්වය ද මේ සඳහා දක්වන දායකත්වය පිළිබඳව පර්යේෂණ සිදු කිරීමටත් හා රාජ්‍යය සහ රාජ්‍යය නොවන සංවිධාන හරහා සිදු කෙරෙන පර්යේෂණ සඳහා මෙම විෂය සම්බන්ධ කිරීම වැනි දෑ යෝජනා කරයි. පර්යේෂණ කාලය ප්‍රමාණවත් නොවීම, පිළිතුරුවල නිරවද්‍යතාවය පුද්ගලානු බද්ධවීම හා විෂය පථය පටු වීම අධ්‍යයනයේ සීමාවන් වේ. අවසාන වශයෙන් සී/ස දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතියේ බීජ වී ගොවීන් පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනයේදි බීජ වී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත් වර්තමානය වන විට මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වීමට මහවැලි බී කලාපයේ ගොවීන් මැලිකමක් දක්වන බවත්, නව ගොවීන් ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ වීම අවම මට්ටමක පවතින බවත් තහවුරු විය.

**මූල පද:** *සංවිධාන කාර්යසාධනය, නවෝත්පාදන කළමනාකරණය, ඉලක්කගතවීම, තරඟකාරී උපක්‍රම*

# කාන්තාව සවිබල ගැන්වීම සඳහා ග්‍රාමීය බැංකුවල දායකත්වය


ඩබ්.ජී.එම්.ධම්මිකා පෙරේරා[1]

ප්‍රභාත් ගලගමගේ[2]

1. *සමුපකාර සංවර්ධන නිලධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.*
2. *බාහිර දේශක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල.*



අප සමාජයේ කුඩාම ඒකකය ලෙස සලකනු ලබන පවුල් ඒකකය තුල කාන්තාව විශාල කාර්යභාරයක් ඉටු කරන බව නොරහසකි. මෙම අධ්‍යයනයේදි ග්‍රාමීය බැංකු අංශය මඟින් කාන්තාව සවිබල ගැන්වීමට ලබා දෙනු ලබන දායකත්වය කොතෙක් ද යන්න සොයා බැලීම අරමුණ වී ඇත. ඒ සඳහා අධ්‍යයනට ලක් කරනු ලබන පොලොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල හා වැලිකන්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකම ඇතුලත් දිඹුලාගල විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශය මඟින් ලබාදී ඇති හා දායකත්වය පිළිබඳ අධ්‍යයනය තුලින් ඔවුන්ගේ දායකත්වය මැන බැලිය හැකිය. බලප්‍රදේශය තුල ජීවත් වන කුටුම්භයන්හි ආර්ථික මට්ටම ඉහල නැංවීම තුලින් කාන්තාව බල ගැන්වීම ප්‍රධාන අරමුණක් බව හඳුනා ගත හැකිය. එහිදී, කාන්තා ව්‍යවසායකයින් වෙත විශේෂ උනන්දුවක් දක්වා ස්වයං රැකියා ණය ලෙස මූල්‍ය සේවා සැපයුම සෘජුවම කාන්තාව ඉලක්ක කරගෙන ක්‍රියාවට නංවා ඇත. අවම සුරැකුමක් යටතේ (සාමාජික ඇප දෙකක් මත) මූල්‍ය සේවා සැපයිමේ කාර්යයේ ග්‍රාමීය බැංකුව කටයුතු කරන බව පැහැදිලි වේ. අධ්‍යයනයට සහභාගි වූ සමිති කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ විමර්ශණය කිරීමේදී සමස්ත නියැදියෙන් (25) රු.15,000 ට අඩු ආදායම් ලාභි 56% ක් සිටින නමුත් ඔවුන් පවුලේ ප්‍රධාන අදායමට අමතරව ස්වයං රැකියා මඟින් යම් දායකත්වයක් ලබාදෙන බව නිරීක්ෂණය විය. අනාවරණික කරුණු අනුව පෙනී යන්නේ ග්‍රාමීය ප්‍රදේශයන්හී කාන්තාවට ආදායම් උත්පාදන කාර්යන්හි වඩාත් සාර්ථකව නියැලීමට හැකි බවයි. එමෙන්ම, ග්‍රාමිය අංශය තුළ සුලභව පවතින කාන්තා ශ්‍රමය හඳුනා ගැනිමටත්, ප්‍රදේශයට සුදුසු ස්වයං රැකියා නිර්මාණය කිරිමටත්, ඒ සඳහා අවශ්‍ය වන්නා වූ පුහුණු වැඩ සටහන් හා ණය වැඩ සටහන් සැලසුම් කිරීමටත් මෙම පර්යේෂණයේ කරුණු උපයෝගී කරගත හැකි බව පර්යේෂකගේ අදහසයි. ඒ අනුව, අධ්‍යයනය නිර්දේශ කරනු ලබන්නේ ග්‍රාමීය මට්ටමේදී දියත් කෙරෙන සංවර්ධන ව්‍යාපෘති හා වැඩ සටහන් සඳහා හැකි සෑම අවස්ථාවකදීම ග්‍රාමීය කාන්තාව සහභාගි කර ගන්නා ලෙසය. කාන්තාවන් පුරුෂ පාර්ශවයට වඩා දියුණුව ගැන සිතිමට උත්සාහ ගන්නා අතර, අනෙක් අතට, තම ව්‍යාපාර වැඩි දියුණු කිරිමට මුදල් යෙදවිමට අකමැත්තක් දක්වන බව ද නිරීක්ෂණය විය.



***මූල පද :*** *කාන්තාව සවිබල ගැන්වීම, ග්‍රාමීය බැංකු, කාන්තා ව්‍යවසාය සංවර්ධනය, ක්ෂුද්‍ර මූල්‍ය*

**සමුපකාර සමිතියක සාර්ථකත්වයට පාරිභෝගික තෘප්තියේ ඇති බලපෑම පිළිබඳ අධ්‍යනය**


එම්.එස්.ජී.ඒ ද සිල්වා[1]
සුජීවා කොඩිතුවක්කු[2]

*1.සමුපකාර සංවර්ධන නිලධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත*
*2.ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කළමනාකරණ පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය*



මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිළධාරී සේවයේ පළමු ශ්‍රේණියේ ආංශික අවශ්‍යයතාවක් වෙනුවෙන් සැපයෙන මෙම පර්යේෂණ නිබන්ධනය තුලින් ලොව පුරා ව්‍යාප්තව ඇති සමුපකාර ව්‍යාපාරයේ ලාංකීය ප්‍රභල සංදිස්ථානයක් වන විවිධ සේවා සමුපකාර සමිතියක සාර්ථකත්වයට බලපානු ලබන සාධකයක් වන පාරිභෝගික තෘප්තිය පිළිබඳව පර්යේෂණයක් තුලින් හඳුනාගැනිමට උත්සාහ කර ඇත. පාරිභෝගික තෘප්තියේ ඇති බලපෑම මත සමුපකාර සමිතියේ සාර්ථකත්වය රඳා පවතින්නේය යන උපන්‍යාසය මත සිට මෙම පර්යේෂණය සිදු කර ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් වූ සංචරණ සීමා මත දත්ත රැස් කිරීමේදී කාලය සීමාවීම හා වෙනත් රාජකාරි අතරතුර මෙම පර්යේෂණය සිදු කිරිමට වීම, යනාදී සීමා අධ්‍යයනය සිදු කිරිමේදී පැන නැගුණි. විවිධ සේවා සමුපකාර සමිති 02 ක් ආශ්‍රිතව සිදුකල මෙම පර්යේෂණයේ බල ප්‍රදේශවල වැසියන්ගෙන් බහුතරය ගොවිතැනින් ජීවනෝපාය ගෙන යන අයවළුන් වේ. පර්යේෂණයේදී සහභාගිත්ව නිරික්ෂණ, සම්මුඛ සාකච්ජා හා ප්‍රශ්නාවලියක් යොදා ගෙන දත්ත රැස්කර ඇත. තවද, සමුපකාර ව්‍යාපාරය සමඟ පර්යේෂිකාව කටයුතු කිරීම තුලින් ලද දැනුම ද මෙම දත්ත රැස්කිරීමේදී මහෝපකාරී වී ඇත. සාහිත්‍ය විමර්ෂණයට අනුව අලෙවිකරණ ශිල්පීයක්‍රම පාරිභෝගිකයන් ඇදා ගැනීමට වැදගත් බව පෙනී ගොස් ඇත. දත්ත විශ්ලේෂණයේදී හඳුනාගත හැකි වන්නේ පාරිභෝගික තෘප්තිය ඉහල නංවා නොගැනීම කෙරෙහි නිසි කළමනාකරණ තීරණ නොගැනීම, සේවක අභිප්‍රේරණය ප්‍රමාණවත් නොවීම, නවීන තාක්ෂණය භාවිතා නොකිරීම යනාදිය මත පාරිභෝගික තෘප්තිය ගිලිහී යාම මත සමුපකාර සමිති ලාභය පහල යාම තුල සමුපකාර සමිතිය සාර්ථක නොවීමට හේතු වී ඇති බවයි. මෙහි දත්ත විශ්ලේෂණය තුලින් උපන්‍යාසය සාධනය වන අතරම, සමුපකාර සමිතියක සාර්ථකත්වයට පාරිභෝගික තෘප්තිය බලපෑමක් සිදුකරන බව අනාවරණය විය.



***මූල පද:*** *සමුපකාර සමිතියක සාර්ථකත්වය, පාරිභෝගික තෘප්තිය, අලෙවිකරණය, තීරණ ගැනීමේ ක්‍රියාවලිය*

## විවිධ සේවා සමුපකාර සමිති පාරිභෝගික අංශයේ සාර්ථකත්වය උදෙසා අලෙවි උපක්‍රම වල ප්‍රමාණාත්මකභාවය ( සී/ස ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය ආශ්‍රිත සිද්ධි අධ්‍යනය)

ඩබ්. එම් බණ්ඩාර[1]
ප්‍රභාත් ගලගමගේ[2]

1. *සමුපකාර සංවර්ධන නිලධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව*
2. *බාහිර දේශක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල*

මෙම අධ්‍යනය තුළින් සමුපකාර සමිති අංශයේ අලෙවි උපක්‍රම කෙතෙක් දුරට තම ව්‍යාපාර කටයුතු වලදී භාවිතා කර ඇද්ද යන්නත් ඒ තුලින් ව්‍යාපාරයේ ඵලදායිත්වයට කෙතරම් බලපෑම් සිදු වී තිබේද යන්න සී/ස ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිති ආශ්‍රයෙන් අධ්‍යනය කර ඇත. අධ්‍යයනයේදී සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, වාර්තා ප්‍රකාශන මඟින් තොරතුරු රැස්කිරීම සිදුකර ඇත. පර්යේෂණය පුළුල් අධ්‍යනයක් මත සිට නොව සිමීත භූගෝලීය කලාපයක් පදනම් කරගනිමින් සිදුකර ඇති අතර,කාලය සහ අනෙකුත් බාහිර තත්වයන් හේතුවෙන් පර්යේෂණය පුළුල් ක්ෂේත්‍රයක් තුල සිදු කිරිම අපහසු විය. අධ්‍යයනය සඳහා පදනම් කරගත් සමුපකාර සමිතිය කොතෙක් දුරට අලෙවි උපක්‍රම භාවිතා කර ඇද්ද යන්න, විමර්ශණය කෙරෙන අතර, දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති වෙනත් සමුපකාර සමිතියක් සමඟ සංසන්දනාත්මක විග්‍රහයක් සිදු කර ඇත. දත්ත විශ්ලේෂණය අනුව සලකා බැලිමේදී අධ්‍යයනයට පාදක වු සමුපකාර සමිති තම පාරිභෝගික අංශයේ කටයුතු වලදී අලෙවි උපක්‍රම භාවිතා කිරීම දුර්වල මට්ටමක පවතින බව තහවුරු විය. ඒ තුලින් පාරිභෝගික අංශයේ ලාභදායිකත්වයට මෙන්ම සමිති ඵලදායිත්වයට ඍජුව බලපෑම් ඇති වී ඇති බවට තහවුරු විය. අනෙක් අතට, අලෙවි උපක්‍රම භාවිතා කරනු ලබන සමුපකාර සමිතියේ, පාරිභෝගික අංශයේ ලාභදායිත්වය තුලින් එම සමිතියේ, ඵලදායිත්වය වැඩිකර ඇති බව තහවුරු වේ. දත්ත විශ්ලේෂණයේදී උපන්‍යාසය සියල්ල ධනාත්මකව සාධනය විය. සමුපකාර සමිති තම පාරිභෝගික අංශයේ කටයුතු සඳහා අලෙවි උපක්‍රම භාවිතා නොකිරීම ව්‍යාපාරයට අහිතකර බලපෑම් ඇති කර ඇති බව අධ්‍යයනයේ අවසාන නිගමනයි.

***මූලපද :*** *පාරිභෝගික අංශය, අලෙවි උපක්‍රම , ඵලදායිත්වය*

## සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය සඳහා පුහුණු මානව සම්පත මඟින් සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යනය


චන්දිම කුමාරි ඒකනායක[1]

ආරියරත්න හේරත්[2]

1. *සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව*
2. *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.*



සමුපකාර සංවිධාන මහජනතාව තුලින්ම බිහිවූ සංවිධාන විශේෂයකි. වර්තමාන තරඟකාරී ආර්ථික රටාව තුල සමුපකාර සංවිධාන පුද්ගලික ව්‍යාපාර සමඟ තරඟකාරි ලෙස ඉදිරියටම යාම සඳහා එම සමිතිය සතු මානව සම්පත කාර්යක්ෂමව උපයෝජනය කලයුතුව ඇත. මෙම පර්යේෂණය මඟින් සිදු කරනු ලැබුවේ සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය උදෙසා පුහුණු මානව සම්පත මඟින් සිදු කරන බලපෑම අධ්‍යනය කිරිමයි. මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය තුලින් සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය හා ලාභදායිත්වය ඉහල නැංවිය හැකි ද? යන්න පර්යේෂණ ගැටළුව විය. සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය සඳහා පුහුණු මානව සම්පත මඟින් සිදුකරන බලපෑම හදුනාගැනීම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ විය. ප්‍රධාන අරමුණට අමතරව පර්යේෂකයා විසින් තවත් උප අරමුණු හතරක් ගොඩනඟනු ලැබූ අතර, ඒවා අනුපිලිවෙලින් පහත ලෙස ඉදිරිපත් වේ. පුහුණු හා නිපුණත්වයක් අධ්‍යයනය කිරීම, මානව සම්පත් සංවර්ධනය තුල රැඳි පවතින්නේ ද යන්න අධ්‍යයනය කිරීම , මානව සම්පත් සංවර්ධනය තුලින් සමුපකාර සමිතිවල සමුපකාර ආයතන තුල සේවකයන් බඳවා ගැනිම, උසස් කිරිම අභිප්‍රේරණය කළමනාකරණය න්‍යායන්ට අනුකූලව ක්‍රියාත්මක වේද යන්න විමසා බැලීම, සෑම ව්‍යාපාර අංශයකම කටයුතු සඳහා සේවකයන් පුහුණු කිරීමේ ක්‍රමවේද සකස් කිරිමේ වැදගත්කම පිළිබද විශ්ලේෂණය. සාහිත්‍යය විමර්ශණය මඟින් පර්යේෂකයා සමුපකාර ඉතිහාසය, ශ්‍රි ලංකාවේ සමුකාර ව්‍යාපාරයේ ආරම්භය හා විකාශනය, සංවිධාන කළමනාකරණය ,මානව සම්පත කළමනාකරණය, කාර්යක්ෂමතාවය, පුහුණුව හා සංවර්ධනය , ඉතා ගැඹුරින් අධ්‍යයනය කර පර්යේෂණ අරමුණ ලඟාකර ගැනිමට අවශ්‍ය පසුබිම සකසා ගන්නා ලදි. පර්යේෂක විසින් මෙම පර්යේෂණය මෙහෙයවීමේදී ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන ලද අතර, ප්‍රශ්නාවලියක් මඟින් දත්ත එකතු කිරීම සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මකව මැනිය හැකි ක්‍රමවේද යොදාගත් අතර, එහිදී මාතය, මධ්‍යනය හා මධ්‍යස්ථය යොදා ගෙන සංඛ්‍යාත්මක තොරතුරු විශ්ලේෂණය කරන ලදි. තවදුරටත් වගු, ප්‍රස්ථාර භාවිතා කර විස්තරාත්මකව දත්ත විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරිම සිදු කරන ලදි. මාතලේ දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 09 ක් හා මුල්‍ය සේවා සමිති දෙකක සේවයේ නියුතු සේවකයින් 524 ක් අතුරින් මාතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල පිහිටි එක් විවිධ සේවා සමුපකාර සමිතියක් හා මුල්‍යය සේවා සමිතියක සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ද ඉවත්ව ගිය සේවකයින්

කිහිප දෙනෙක්ද දත්ත රැස් කිරිමට නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. ප්‍රාථමික තොරතුරු ප්‍රශ්ණාවලියක් මඟින් ද, සම්මුඛ සාකච්ජා සහභාගිත්ව නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයනය මඟින් ද රැස්කර ගන්නා ලදි. ඒ අනුව නියැදිය සඳහා 118 දෙනෙකු සහභාගි විය. සමිතිවල ආසන්න වර්ෂ 05 ක විගණන වාර්තා, මාසික මෙහෙයුම් වාර්තා, ආංශික මුල්‍යය ප්‍රකාශන වැටුප් ලේඛන ,කොමිෂන් සභා රෙගුලාසි මාලා හා චක්‍රලේඛ මඟින් ද්විතියික දත්ත රැස් කර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයේ දි ආයතනයේ කාර්යක්ෂමතාවය සඳහා ලාභදායිත්වය, වත්කම් ඉපයීම, මාසික පිරිවැටුම වැනි සාධක සලකා බලන ලදි. තවදුරටත් ,මානව සම්පතේ දායකත්වය සඳහා මානව සම්පත් සංවර්ධනයට අදාල වන න්‍යායත්මක කරුණු මෙම ආයතනය තුල ප්‍රශස්ථ මට්ටමෙන් පවත්වාගෙන යන්නේ ද? යන්න විශ්ලේෂණය කරන ලදි. මානව සම්පත බඳවා ගැනිම, ඉවත්වීම හා ඊට අනුමත නිතිරීති පිළිබඳව දත්ත විශ්ලේෂණාත්මකව විග්‍රහ කරන ලදි. දත්ත විශ්ලේෂණය හා සාකච්ජා ඔස්සේ සාධනය වු කරුණක් වුයේ සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය සඳහා පුහුණු මානව සම්පත මඟින් බලපෑමක් සිදුවන බවයි. සමිතිවල ලාභ උත්පාදනය සඳහා පුහුණු මානව සම්පත දායක වන බව සංඛ්‍යා හා දත්ත වලින් තහවුරු කරන ලදි. එමෙන්ම, දත්ත තවදුරටත් විශ්ලේෂණයේ දී ලාභ උත්පාදනය තුලින් සමිතිවල කාර්යක්ෂමතාවය වර්ධනය විමද , ඒ තුලින් සාමාජික සංවර්ධනය ද සිදුවන බව සාධනය විය. දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව සාධනය වු කරුණු මත පර්යේෂක විසින් පහත නිගමනවලට එළැඹෙන ලදි. සමුපකාර සංවිධාන සඳහා සේවකයින් බඳවා ගැනිම, උසස් කිරිම,පුහුණු කිරිම, විනය කටයුතු පිළිබඳ සකස්කර ඇති නීති රෙගුලාසි අනුව සේවක කටයුතු පවත්වාගෙන යාම තුලින් ආයතනික කාර්යක්ෂමතාවය වර්ධනය කරගත හැකි වීම. එමෙන්ම, බඳවා ගැනිම අවිධිමත් විම තුලින් සේවක පාලනය අපහසුවිම හා ආයතනයේ පලපුරුදු සේවකයින් අතෘප්තිමත් වීම ,ආයතනයේ කාර්යසාධනය හීනවිමට බලපානු ලබයි. තවදුරටත්, සමුපකාර සේවකයින් පුහුණුව මදිකම මත යාන්ත්‍රිකකරණය වී ඇත. සේවක කටයුතු සඳහා වැයවන කාලය අධික විම මත සමිතිවල සේවක කාර්යක්ෂමතාවය පහලයාමත් ආයතනයේ කාර්යක්ෂමතාවය පහලයාමත් සිදු වේ. එබැවින් විනය කටයුතු කඩිනම් කිරිම සඳහා පවතින නීතිරීති යාවත්කාලීනවීමේ අවශ්‍යතාවයක් පවති. සමුපකාර සංවිධාන වල අඛණ්ඩ පැවැත්ම සඳහා ලාභ උත්පාදනය සිදුකල යුතුය. ඒ තුලින් සේවක හා සාමාජික ප්‍රජාව සංවර්ධනය කළ හැකිය.

**මුලපද :** *කාර්යක්ෂමතාවය , පුහුණු මානව සම්පත , ලාභදායිත්වය*

**විවිධ සේවා සමුපකාර සමිතියක භෞතික හා මානව සම්පත් උපයෝජනය.**
**(සි/ස නාඋල විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරින් )**

කේ.ඩබ්.බී.එල්.ආර් බෝධිපක්ෂ[1]
ආරියරත්න හේරත්[2]

1. *සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව*
2. *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය*

විවිධ සේවා සමුපකාර සමිතියක භෞතික හා මානව සම්පත් උපයෝජනය කිරිම පිළිබඳව පරික්ෂාකිරිම මෙම පර්යේෂණයේ දී සිදුව ඇත. කාලය මෙම පර්යේෂණයේ ප්‍රධාන සීමාව වු අතර, පර්යේෂණය සිදු කර ඇත්තේ පුළුල් අධ්‍යයන ක්ෂේත්‍රයක් මත සිට නොව පටු භූගෝලීය කලාපයක් කේන්ද්‍රගතවයි. අධ්‍යයනයේදී සහභාගිත්ව නිරික්ෂණය, සම්මුඛ සාකච්ජා හා වෘත්තීය අත්දැකිම් ද උපයෝගී කරගෙන ඇත. සාහිත්‍යය විමර්ශනය මඟින් ආර්ථිකය තුල ඇති සම්පත් හඳුනා ගැනීමත්, සම්පත් සමුපකාර ව්‍යාපාර තුල උපයෝජනය වන ආකාරයත් හඳුනා ගෙන ඇත. දත්ත විශ්ලේෂණය ඔස්සේ විවිධ සේවා සමුපකාර සමිතිය සතු සම්පත් හඳුනා ගෙන එම සම්පත් සමුපකාර සමිතිය තුල දැනට උපයෝජනය කරන ආකාරය පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකර ඇත. මෙම දත්ත විශ්ලේෂණය මඟින් නිගමනය වන්නේ විවිධ සේවා සමුපකාර සමිති තමන් සතු භෞතික හා මානව සම්පත් උපයෝජනය සමිතිවල ඵලදායීතාවය හා තිරසාර සංවර්ධනය ඇතිවන ආකාරයට සිදු නෙවන බවයි. සමුපකාර ව්‍යාපාරය තුල තිරසාර සංවර්ධනයක් ඇති කිරිමට ඉවහල්වන ප්‍රතිපත්තිමය ගම්‍යවීම් කිහිපයක් ද පර්යේෂණය තුලින් හඳුනාගෙන සටහන් කර ඇත. ඒ අතුරින් නව්‍යතා බිහිකිරිම, නව ව්‍යාපෘති ආරම්භ කිරිම, ප්‍රතිචක්‍රීකරණයට හුරුවීම,මානව සම්පත පුහුණු කිරීම, ආකර්ශනීය මිලක්‍රම හඳුන්වාදිම, නව තාක්ෂණය භාවිතා කිරිම වැනි කරුණු දැක්විය හැක.

**මූලපද :** *භෞතික සම්පත්,මානව සම්පත් , කාර්යක්ෂමතාව*

**සේවක ප්‍රතිලාභ සේවක තෘප්තියට බලපාන ආකාරය පිළිබඳව අධ්‍යනය : පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල වෙළඳසැල් කළමනාකරුවන් ආශ්‍රයෙන් කරනු ලබන පර්යේෂණය**

එස්.ජේ.රාජපක්ෂ[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිලධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත.*
*2. කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර.*

මෙම පර්යේෂණය පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල පාරිභෝගික වෙළඳසැල් කළමනාකරුවන් 57 දෙනෙකු ඇසුරින් සිදු කරන ලදි. වෙළෙඳසැල් කළමනාකරුවන් සේවය අතහැර යාම හා ප්‍රාදේශික වෙළඳසැල් දිගින් දිගටම අලාභ ලැබීම යන ගැටළුවලට හේතුව විමසා බැලීම මෙතුලින් සිදු කරන ලදි. මෙම ගැටළුව විමසා බැලිමට පර්යේෂණ අරමුණු ගොඩනැගු අතර, සංකල්පනාත්මක රාමුව සකස් කොට උපන්‍යාස ගොඩනඟන ලදි. පුළුල් සාහිත්‍ය විමර්ශනයක් සිදු කල අතර, අන්තර්ජාතිකව පිළිගත් පර්යේෂණ ක්‍රමවේදයන්ට අනුව ප්‍රශ්නාවලිය ගොඩනඟා ඒ අනුව දත්ත එක් රැස්කොට SPSS මාර්ගයෙන් විශ්ලේෂණය කල අතර එමඟින් නිගමන හා නිර්දේශයන්ට එළඹෙන ලදි. ඒ අනුව, සේවකයන් ලබන ප්‍රතිලාභ හා ඔවුන්ගේ තෘප්තිමත්භාවය අතර ඇති සම්බන්ධතාවය මෙහිදී, පර්යේෂණයට බඳුන් කල ප්‍රධාන කරුණ විය. ඒ අනුව සේවකයන් ලබන ප්‍රතිලාභ හා තෘප්තිමත්භාවය අතර, ධන සබඳතාවයක් පවතින විට සේවකයන්ගේ තෘප්තියද ඉහළ මට්ටමක පවතින බවත්, සේවක ප්‍රතිලාභ පහල මට්ටමක පවතින විට සේවකයක්ගේ තෘප්තියද පහල මට්ටමක පවතින බවත් අනාවරණය විය. මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය අනුව වෙලඳසැල් කළමණාකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ ඉතාම අවම මට්ටමක පවතින බව අනාවරණය වූ අතර එය ඔවුන්ගේ තෘප්තිමත්භාවය අවම වීමට බලපා ඇති බව තහවුරු විය. අතෘප්තිමත් කළමණාකරුවන් කෙටි කාලයක් තුල සේවය හැර යාමේ ප්‍රවණතාවයක් දක්වන අතර, ඔවුන්ගෙන් අපේක්ෂිත සේවය ඉටු නොවීම ද මෙහි දී අනාවරණය විය. මේ අනුව මෙම වෙලඳසැල් අලාභ ලබන තත්වයට පත්වීමට අතෘප්තිමත් කළමනාකරුවන් ද හේතු වී ඇති බව කිව හැකිය.

***මූලපද:*** *සේවක ප්‍රතිලාභ,සේවක තෘප්තිය,වෙළඳසැල්*

# ග්‍රාමීය ණය අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකුවල ප්‍රමාණාත්මක දායකත්වය පිළිබඳ අධ්‍යනය

(සී/ස යටිනුවර ගහපලාත විවිධ සේවා සමුපකාර සමිතිය ආශ්‍රයෙන්)

ඩී.ඒ.ආනන්ද කුමාර[1]

පි.ගලගමගේ[2]

*1. සමුපකාර සංවර්ධන නිලධාරි,මධ්‍යම පළාත.*

*2. බාහිර දේශක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

ග්‍රාමීය ණය අවශ්‍යතාව සපුරාලීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකුවල ප්‍රමාණාත්මක දායකත්වය මැනබැලීම මෙම පර්යෙයේෂණය මඟින් සිදු කර ඇත. ග්‍රාමීය අංශය තුල මූල්‍ය අවශ්‍යතාවලදී වසර 50 කට අධික කාලයක් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරය ග්‍රාමීය සාමාජික හා සාමාජික නොවන ප්‍රජාවගේ මූල්‍ය අවශ්‍යතා සැපිරීමේදි වැදගත් මෙහෙයක් ඉටුකරනු ලබයි. මෙම පර්යේෂණය සඳහා සීමාසහිත යටිනුවර ගහපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශය යටතේ වන ග්‍රාමීය බැංකු ශාඛා යොදාගෙන ඇත. එහිදි සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවල වසර 05 ක දත්ත සහ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය මත තෝරාගත් සාමාජිකයින් සම්මුඛ සාකච්ජා වලට භාජනය කර තොරතුරු ලබාගත් අතර, නියැඳියක් මඟින් තෝරාගත් සාමාජිකයින්ට ප්‍රශ්ණාවලියක් මඟින් තොරතුරු ලබාගෙන පර්යේෂණය සිදු කරන ලදි. මෙම පර්යේෂණයට සහභාගිත්ව නිරික්ෂණය ද උපයෝගි කරගෙන ඇත. සාහිත්‍ය විමර්ශණය මඟින් මෙම පර්යේෂණයට පෙර සිදු කල පූර්ව පර්යේෂණ දත්ත සමඟ සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරය විවේචනාත්මකව විග්‍රහ කර ඇත. දත්ත විශ්ලේෂණය මඟින් මෙම පර්යේෂණය සම්බන්ධයෙන් සාධනය කිරිමට බලාපොරොත්තු වන උපන්‍යාසය වන ශ්‍රි ලංකාවේ සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරය මඟින් සාමාජිකයින්ට ණය පහසුකම් වසර 50 කට අධික කාලයක් ප්‍රමාණාත්මකව සැපයිම මඟින් සිය සාමාජික ප්‍රජාවගේ ආර්ථික සාමජීය සහ සංස්කෘතික සංවර්ධනයට හිතකර ලෙස බලපානු ලැබ තිබේ යන්න සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් සාධනය වන බවට නිගමනය විවේචනාත්මකව විග්‍රහ කර ඇත. මේ සඳහා වන සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරය දෙසින් ඇමතිය හැකි ප්‍රතිපත්තිමය ගම්‍යවීම් කිහිපයක්ද පර්යේෂකයා විසින් හඳුනාගෙන සටහන් කර ඇත. ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාවය සලකා බලමින් ණය සැපයිමටත් ණය නැවත අයකර ගැනිමට සුදුසු ක්‍රමවේද අනුගමනය කලයුතු බවත් ණයදිම මඟින් ප්‍රජාව සවිබල ගැන්විය යුතු බවත්, නව්‍යය වූ ණය ක්‍රම හඳුන්වාදිමටත් පර්යේෂකයා මෙහිදි අවසාන වශයෙන් සමිති සඳහා යෝජනා කරනු ලබයි.

**මූලපද:** *ග්‍රාමීය ණය. සමුපකාර ග්‍රාමීය බැංකු ,සාමාජික ප්‍රජාව*

## සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ණය නිකුත් කිරිමේ ක්‍රියාවලිය ණය අකාර්යවීම කෙරෙහි සිදු කරනු ලබන බලපෑම

එච්.ලලිත් කුමාර[1]
ශානිකා මුදන්නායක[2]

1. *සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව*
2. *කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර*

බහුතරයක් සමුපකාර ග්‍රාමීය බැංකු හා සණස සමිති වලින් සාමාජික ප්‍රජාව වෙත නිකුත් කර ඇති ණය අකාර්ය වීම (කල්පසු) වර්තමානයේ දී ප්‍රධාන ගැටළුවක් බවට පත්වී ඇත. සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ණය නිකුත් කිරිමේ ක්‍රියාවලිය ණය අකාර්යවීම කෙරෙහි සිදු කරනු ලබන බලපෑම විමසා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මහනුවර දිස්ත්‍රික්කයේ ගඟසිරිපුර කලාපයේ පිහිටි සී/ස ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය සහ ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශ වලට අයත් ග්‍රාමීය බැංකු 30 කට අයත් ණය නිළධාරින් 84 දෙනෙක් සම්බන්ධ කරගනිමින් පර්යේෂණය දියත් කරන ලදි. සාහිත්‍යය විමර්ශනය මඟින් පර්යේෂකයා ණයකරුවන්ගේ ඉතිහාසය, ප්‍රාග්ධනය, ණය මුදල, ණය ගැනිමේ වාර ගණන, ණය ප්‍රතිලේඛන ගත කිරිම, ක්ෂුද්‍ර මුල්‍ය ක්‍රමවේදය පිළිබඳව පුළුල් ලෙස අධ්‍යයනය කරන ලදි. ඒ අනුව ණය තක්සේරු ක්‍රියාවලිය විධිමත් නොවීම නිසා අකාර්ය ණය ප්‍රමාණය වැඩි වන බව සාහිත්‍යය විමර්ශනයේදී අනාවරණය විය. එම දත්ත මත එය තක්සේරු ක්‍රියාවලියට බලපාන උපසාධක ලෙස ඉතිහාසය, ප්‍රාග්ධනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ආදායම් මට්ටම, ණය මුදල හා ණය ගෙවීමේ වාර ගණන හඳුනා ගන්නා ලදි. ණය අක්‍රීයවිමට සහ මුල්‍ය තිරසාර බවට බලපාන උපසාධක ලෙස බොල්ණය, කල්පසු ණය වාරික ප්‍රමාද වී ගෙවීම, ණය ප්‍රතිලේඛනගත කිරීම, ද්‍රවශීලතාවය අඩුවීම හා ආදායම අඩුවිම ලෙස හඳුනාගන්නා ලදි. සාහිත්‍යය විමර්ශනයේදී සොයාගත් කරුණු මත පර්යේෂකයා විසින් උපන්‍යාසය 06 ක් ගොඩනඟා ගත් අතර ඒවා අනුපිළිවෙලින් පහත පරිදි දැක්විය හැක. ණයකරුවන්ගේ ඉතිහාසය පිළිබඳ කරුණු විමසීමක් නොකිරීම ණය අකාර්යවීමට ධනාත්මකව බලපායි. ($H_1$), ණයකරුවන්ගේ ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම නිසා ණය අකාර්ය විමට ධනාත්මකව බලපානු ලබයි.($H_2$), ණයකරුවන්ගේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධව අධ්‍යයනය නොකර ප්‍රදානය කිරීම ධනාත්මකව බලපායි. ($H_3$) ණය කරුවන්ගේ ආදායම් මට්ටම පිළිබඳ අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම ධනාත්මකව බලපානු ලබයි. ($H_4$), ණයකරුවන් වෙත ප්‍රදානය කළයුතු ණය මුදලේ ප්‍රමාණය තීරණය නොකර ණය ප්‍රදානය කිරිම ණය අකාර්යවිමට ධනාත්මකව බලපායි. ($H_5$) ණය තක්සේරු කරන සමස්ථ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරිම ණය අකාර්යවිමට ධනාත්මකව බලපානු ලබයි. ($H_6$). මෙම

පර්යේෂණය ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් මත සිදු කරනු ලැබූ ගවේෂණාත්මක අධ්‍යයනයකි. අධ්‍යනය සඳහා සී/ස ගම්පොල විවිධ සේව සමුපකාර සමිතිය, සි/ස ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශවල පිහිටා ඇති ග්‍රාමීය බැංකු 30 ක් තෝරා ගන්නා ලදි. සංගණනය ග්‍රාමීය බැංකු ශාඛා 30 ක සේවයේ යෙදී සිටින බැංකු කළමනාකරුවන්, කළමනාකරණ සහයකයන්, කාර්යාල සහයකයන්ගෙන් සමන්විත වේ. නියැදිය ලබාගැනිමේදී පොකුරු නියැදි ක්‍රමය භාවිතා කරන ලද අතර බැංකු කළමනාකරුවන් 30 ක් නියැදිය සඳහා තෝරා ගන්නා ලදි. පර්යේෂක විසින් සංකල්පීය රාමුව ගොඩනඟනු ලැබූ අතර, එහි පරායත්ත විචල්‍යය ලෙස මූල්‍ය තිරසාර බව හඳුනා ගන්නා ලදි. ස්වයාත්ත විචල්‍යය ලෙස ණය තක්සේරු ක්‍රියාවලිය හඳුනාගන්නා ලද අතර, එහි උප විචල්‍යයන් ලෙස ඉතිහාසය, ප්‍රාග්ධනය, ණයමුදල්, ආදායම් මට්ටම, මුදල් ප්‍රමාණය සහ ණය ගැනිමේ වාර ගණන සලකා බලන ලදි. දත්ත විශ්ලේෂණයේදි තෝරාගත් නියැදියෙන් 68% ක් ස්ත්‍රීන්ද , 32% ක් පුරුෂ ද බව අනාවරණය විය. තවදුරටත් නියැදියෙන් 68% ක් විවාහක පුද්ගලයින්ද ,32% ක් අවිවාහක පුද්ගයින් බව අනාවරණය විය. තවදුරටත් විශ්ලේෂණය කිරිමේදී නියැදියෙන් 48% ක් වයස අවුරුදු 20-30 අතර, පුද්ගලයන්ද 52% ක් වයස අවුරුදු 40-60 අතර, පසුවන බව හෙලිදරව් විය. සේවා කාලය අවුරුදු 1-10 අතර 28% ක් ද අවුරුදු 11-20 අතර, 36% ක්ද නියැදිය තුල සිටි. නියැදියේ මාසික ආදායම සලකා බලන කල මාසික ආදායම රු.25,000 අඩු පුද්ගලයින් 13 ද ( 52%) රු.25,000/-ට වැඩි පුද්ගලයින් 12 (48%) ද සිටින බව අනාවරණය විය. දත්තවල විශ්වාසනීය බව Cronbach's alpha සංගුණය මඟින් ගණනය කරනු ලැබූ අතර, සියළුම ප්‍රශ්න සඳහා අගය 0.7 වඩා වැඩි අගයන් ලැබී තිබුණි. ඒ අනුව දත්ත විශ්වාසදායී ලෙස විශ්ලේෂණය කලහැකි බව තහවුරු විය. විචල්‍යයන් අතර, සහ- සම්බන්ධතාවය පියර්සන් සහසම්බන්ධතාවයෙන් මිණුම් කරනු ලැබූ අතර, සියලු ස්වායත්ත විචල්‍යයන් පරායත්ත විචල්‍යයට සහසම්බන්ධතාවයක් දක්වන බව සාධනය විය. ඉහත දත්ත විශ්ලේෂණය මඟින් සංකල්පනාත්මක රාමුව මඟින් ගොඩනඟා ඇති උපන්‍යාසයන් එනම්, ණය තක්සේරු ක්‍රියාවලිය නිවැරදි නොවන නිසා එය ණය ආකාර්ය විමට සෘජුවම බලපාන බව තහවුරු විය. එම නිසා අහිතකර ණය ප්‍රතිශතය වැඩිවිම නිසා පොලී ආදායම අඩුවිම තුලින් මූල්‍ය තිරසාරභාවය එනම් කාරක ප්‍රාග්ධනය ඌන විම සහ ද්‍රවශීලතාවය හීනවන බව ප්‍රකාශ කල හැක. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව පර්යේෂක විසින් පහත නිර්දේශ ලබාදෙනු ඇත. ණය අවශ්‍යතාවය අනුව ණය වර්ග කිරිම, ආපසු ගෙවන කාලය අනුව ණය වර්ග කිරිම , ණය නිකුත් කිරිම පියවර ක්‍රමයට සිදු කිරිම ඒ අතුරින් ප්‍රමුඛ වේ. ඉදිරි පර්යේෂණ සඳහා නියැදිය වැඩිකර පළාත් කිහිපයක මෙම අධ්‍යයනය සිදු කිරිමට පර්යේෂක නිර්දේශ කරයි.

**මූලපද:** *ණය ක්‍රියාවලිය, තක්සේරු ක්‍රියාවලිය,අකාර්ය ණය,මූල්‍ය තිරසාර බව*

# සංවිධානවල සේවක ප්‍රතිලාභ ක්‍රමවේදය සේවක රැකියා කැපවීමට බලපානු ලබන ආකාරය : මධ්‍යම පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන් ඇසුරින්

ඩබ්.බී.සමරකෝන්[1]
ශානිකා මුදන්නායක[2]

*1. සමුපකාර සංවර්ධන නිලධාරී, මධ්‍යම පළාත*
*2. කථිකාචාර්ය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය,මහනුවර*

මෙම පර්යේෂණයේ අරමුණ වුයේ සංවිධානවල සේවක ප්‍රතිලාභ ක්‍රමය සේවක කැපකිරිමට සිදුකරන බලපෑම සොයා බැලීමයි. පර්යේෂණ නියැදිය ලෙස මධ්‍යම පළාතේ දිස්ත්‍රික්ක තුනම නියෝජනය වන පරිදි ග්‍රාමීය බැංකු කලමනාකරුවන් 80 දෙනෙකු ස්ථරීකෘත නියදිම් ක්‍රමය අනුව තෝරා ගෙන ප්‍රතිලාභ සහ සේවක කැපවීම පිළිබඳව සකස් කල සංවෘත ප්‍රශ්ණාවලියක් ඉදිරිපත් කර දත්ත රැස් කෙරුනි. ප්‍රශ්ණාවලියේ විචල්‍යයන්ගේ විශ්වාසනීයත්වය Cronbach's alpha සංගුණකය මඟින් විශ්ලේෂණය කර ඇත. සංඛ්‍යානමය ගණනය කිරිම් මඟින් දත්ත විශ්ලේෂණය කල අතර පර්යේෂණ ප්‍රතිඵල වලින් දැක්වුයේ මධ්‍යම පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමණාකරුවන්ට ලබාදෙන මුල්‍ය ප්‍රතිලාභ සහ සේවක කැපවීම අතර, 0.853 ක ඉතා ප්‍රබල ධන සහසම්බන්ධතාවයක් පෙන්නුම් කරන බවයි. එනම්, සේවක වැටුප් ,දිරිදීමනා ,ප්‍රසාද දීමනා වෛද්‍ය ආධාර, අතිකාල දීමනා, ගමන් බිමන් දීමනා ඇතුළු සේවකයන්ට දෙනු ලබන මුල්‍ය ප්‍රතිලාභ සේවක කැපකිරිම කෙරෙහි ධනාත්මකව බලපානු ලබන බවයි. ප්‍රතිඵල විශ්ලේෂණය අනුව මුල්‍ය නොවන ප්‍රතිලාභ වලට වඩා මුල්‍ය ප්‍රතිලාභ සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන්ගේ සේවක රැකියා කැපකිරිම් කෙරෙහි ප්‍රබලව බලපාන බව පෙන්වයි. ඒමෙන්ම, දත්ත විශ්ලේෂණ ප්‍රතිඵලය අනුව ග්‍රාමීය බැංකු කළමනාකරුවන්ට ලබාදෙන මුල්‍ය නොවන ප්‍රතිලාභ සහ සේවක කැපවිම අතර 0.789 ක ප්‍රබල ධන සහම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. ඉන් අදහස් වන්නේ බැංකු කළමනාකරුවන්ගේ ඉටුකරන වැඩ කොටස් පිළිගැනිම හා ඇගයීමට ලක්කිරිම, ඔවුනට රාජකාරි ඉටුකිරිමට අවශ්‍ය ප්‍රමාණවත් උපකරණ හා ද්‍රව්‍ය සපයාදීම, නවීන දැනුම හා පුහුණුව ලබාදිමට කටයුතු කිරිම , සේවක හැකියාවට ඉඩ සලසා තිබිම, දක්ෂතාව හා කුසලතාවය මත පදනම් වු උසස්විම් ක්‍රමවේදයක් පැවතීම වැනි මුල්‍ය නොවන ප්‍රතිලාභ ද සේවක කැපකිරිම කෙරෙහි ධනාත්මකව බලපානු ලබන බවයි. තවද, සේවකයන් හට සාධාරණ යැයි හැඟෙන මුල්‍ය ප්‍රතිලාභ ලබාදීමටත් මුල්‍ය නොවන ප්‍රතිලාභ ද සැලසුම් කර ලබාදීමටත් කටයුතු කිරිම මඟින් සේවක කැපවීම ඉහල නංවා ගැනිමට කටයුතු යෙදිය යුතු බව පර්යේෂණ ප්‍රතිඵල අනුව පැහැදිලි වේ.

**මුලපද:** *සේවක ප්‍රතිලාභ,රැකියා කැපවීම,මුල්‍යය ප්‍රතිලාභ මුල්‍ය නොවන ප්‍රතිලාභ*

## ආයතනික සාමාජීය වගකිම හා පාරිභෝගික තෘප්තිය සී/ස පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරෙන් කරනු ලබන අධ්‍යනය

එන්. කේ සිල්වා[1]
පි.ගලගමගේ[2]

1. *සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, උතුරුමැද පළාත.*
2. *බාහිර දේශක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.*

උතුරුමැද පලාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සී/ස පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතිය අධ්‍යයනය සදහා තෝරා ගන්නා ලදි. සී/ස පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතියේ දැක්ම, මෙහෙවර, සිදු කරනු ලබන සේවාවන්, අරමුණු සමිතියේ යුතුකම් හා වගකීම් මඟින් බලප්‍රදේශයේ පාරිභෝගිකයින් තෘප්තිමත් වී ඇද්ද යන්න අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී, සාමාජිකයින්, පාරිභෝගිකයින්, ගණුදෙනුකරුවන්, සැලසුම්කරුවන් හා සේවකයන් ඔවුන්ගේ අවශ්‍යතා සමිතිය මඟින් ඉටුකර ගෙන තිබේද යන්න අධ්‍යයනය කරන ලදි. සී/ස පලුගස්දමන වි.සේ.ස සමිතියේ ආයතනික සමාජ වගකීම සම්බන්ධයෙන් පාරිභෝගික තෘප්තියට බලපානු ලබන කරුණු 05 ක් ඔස්සේ සේවකයින්, සාමාජිකයින්, ගනුදෙනුකරුවන් හා සාමාජික නොවන පාරිභෝගිකයින් වෙත ප්‍රශ්නාවලියක් ලබාදීමෙන් හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කර මෙම පර්යේෂණය සිදු කරන ලදි. විවිධ සේවා සමුපකාර සමිතියේ ආයතනික, සාමාජීය වගකිම, පාරිභෝගිකයින්ගේ තෘප්තිය කෙරෙහි ප්‍රමාණාත්මකව බලපානු ලබයි. මෙය කරුණු 05 ක් මඟින් නිරික්ෂණය වී ඇත. එනම්, ආයතනික ස්වේච්ඡා වගකීම, නීතිමය වගකීම, ආයතනික ප්‍රතිරූපය සහ පාරිභෝගික පක්ෂපාතිත්වය යන සාධක සමස්ථයක් ලෙස ගත්කල උක්ත සී/ස පලුගස්දමන විවිධ සේවා සමුපකාර සමිතියේ ආයතනික සමාජ වගකීම තීරණය කිරිම කෙරෙහි බලපා ඇත. ඒ අනුව, ආයතනික සමාජ වගකීම පාරිභෝගික තෘප්තිය කෙරෙහි සෘජුවම බලපාන බවත්, මෙම පර්යේෂණ අධ්‍යයන ප්‍රතිඵල වලින් අනාවරණය වී ඇත.

**මූලපද** : *සාමාජීය වගකිම, පාරිභෝගික තෘප්තිය*

**බඳවාගැනීම්, උසස් කිරිම් සහ සංවේතන පටිපාටිය සමුපකාර සේවක පිරිවැටුම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය**

**(පොලොන්නරුව දිස්ත්‍රික් විවිධ සේවා සමුපකාර සමිතිය ඇසුරෙන්)**

ඩී.ජේ. ප්‍රියදර්ශනි[1]
පි.ගලගමගේ[2]

*1.සමුපකාර සංවර්ධන නිළධාරි ,සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,උතුරුමැද පළාත.*
*2. බාහිර දේශක,ජාතික සමුපකාර සමුපකාර සංවර්ධන ආයතනය,පොල්ගොල්ල.*

වර්ෂ 2020 වන විට ශ්‍රී ලාංකීය සමුපකාර ව්‍යාපාරය තුල විවිධ සේවා සමුපකාර සමිති ආසන්න වශයෙන් 306 ක් පමණ ඇති අතර, ඉන් විවිධ සේවා සමුපකාර සමිති 22 ක් උතුරු මැද පළාත තුල ස්ථාපිත වී තිබේ. මෙම ස්වාධීන නිබන්ධනය සඳහා පාදක වී ඇති පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමුපකාර සමිති 09 ක් පිහිටා ඇති අතර, ඉන් සී/ස මැදිරිගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස හිඟුරක්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය හා සී/ස විජිත විවිධ සේවා සමුපකාර සමිතිය අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. ඉහත සඳහන් විවිධ සේවා සමුපකාර සමිතිවල වැදගත්ම සම්පත වන මානව සම්පත සමුපකාර ක්ෂේත්‍රය තුලින් ඉවත් වීමේ කරුණු හඳුනාගැනීමටත්, එම දුර්වලතා මඟහරවා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරිමත් පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වේ. තෝරාගනු ලැබූ විවිධ සේවා සමුපකාර සමිති වල සේවක පිරිවැටුම සඳහා බලපානු ලබන බඳවා ගැනිම්, උසස් කිරීම් හා සංවේතන පටිපාටීන් සම්බන්ධව සමුපකාර සේවය හැරගිය සේවක මණ්ඩල සාමාජිකයින්ගෙන් හා වර්තමානයේ රැදි සිටින සේවකයින්ගෙන් සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස්කර මෙම පර්යේෂණය සිදු කරන ලදි. විවිධ සේවා සමුපකාර සමිතිවල සමුපකාර සේවක පිරිවැටුම කෙරෙහි බඳවා ගැනීම, උසස් කිරිම හා සංවේතන පටිපාටීන් ඍජුව බලපා ඇති බව පැහැදිලිව නිරීක්ෂණය වී තිබේ. සේවක බඳවා ගැනිම්, උසස් කිරිම හා සංවේතන පටිපාටීන් සමුපකාර සේවක පිරිවැටුම නොහොත් සේවකයින් සේවයෙන් ඉවත්වීම කෙරෙහි දැඩි ලෙස බලපා ඇති බව සමස්ථයක් ලෙස ගත්කල මෙම පර්යේෂණ නිබන්ධනයට අදාළ කරගත් සියළුම විවිධ සේවා සමුපකාර සමිතිවල දත්ත විශ්ලේෂණය කිරිම මඟින් ද පර්යේෂණ අධ්‍යයන ප්‍රතිඵල වලින් ද අනාවරණය වී ඇත.

**මූලපද** : *බඳවා ගැනීම උසස් කිරිම, සංවේතන පටිපාටින්,සේවක පිරිවැටුම.*

# පාරිභෝගික අංශ පාඩු ලැබීමට පාදක කළමනාකරණ හේතු පිළිබඳ පර්යේෂණාත්මක සිද්ධි අධ්‍යනය (මහනුවර දිස්ත්‍රික් විවිධ සේවා සමුපකාර සමිති ඇසුරෙන්)

ආර්.එම්.ආශෝක බණ්ඩාර[1]
සුජීවා කොඩිතුවක්කු[2]
ඩී.එන්.දිසානායක[3]

1. *සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.*
2. *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කළමනාකරණ පීඨය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය.*
3. *සහකාර පර්යේෂක,ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,පොල්ගොල්ල.*

ශ්‍රී ලංකාවේ සමුපකාර පාරිභෝගික අලෙවි සේවය වසර 100 කට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලැබේ. විවිධ සේවා සමුපකාර සමිතියක් සතු භිඟ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදවා ගැනිම කළමනාකරණ නම් වේ. විවිධ සේවා සමුපකාර සමිතිවල කළමනාකරණ මණ්ඩලයක් දක්නට ලැබේ. සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිළධාරි වන සාමාන්‍යාධිකාරිවරයා විවිධ සේවා සමුපකාර සමිති වල අග්‍ර කළමනාකරණයට ඇතුළත් වේ. විවිධ සේවා සමුපකාර සමිති බහුතරයක අග්‍ර කළමනාකරණය වගකිම් විරහිතව කටයුතු කිරිම අභියෝගයට ලක්කරමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටළුව ලෙස විවිධ සේවා සමුපකාර සමිති බහුතරයක පාරිභෝගික අංශ අලාභදායිත්වයට පාදක වන කළමනාකරණ හේතු මොනවාද? යන්න පාදක කරගෙන ඇත. ඉහත පර්යේෂණ ගැටළුව මුල් කරගනිමින් පර්යේෂකයා විසින් පර්යේෂණ අරමුණ ගොඩනඟන ලදි. ඒ අනුව පාරිභෝගික අංශ පාඩු ලැබිමට බලපාන කළමනාකරණ හේතු හඳුනා ගන්නා ලදි. පර්යේෂකයා විසින් සමිතියේ කළමනාකරණ හේතු ස්වායත්ත විචල්‍යය ලෙස හඳුනා ගන්නා ලද අතර ස්වායත්ත විචල්‍ය තුල ඇති කළමනාකරණ මණ්ඩල තීරණ මූල්‍ය කළමනාකරණ තීරණ, මානව සම්පත් කළමනාකරණ තීරණ, හා ආයෝජන තීරණ යන සාධක ස්වායත්ත විචල්‍යයේ ප්‍රධාන මානයන් වේ. පාරිභෝගික අංශ අලාභ ලැබිම පරායත්ත විචල්‍ය ලෙස හඳුනා ගන්නා ලදි. පිරිවැය ඉහල යාම, මුදල් හා බඩු අඩුවිම, අපතය නරක්විම් හා මිල අඩුවිම අලාභ සහ පාඩු යන සාධක පරායත්ත විචල්‍යයේ ප්‍රධාන මාන ලෙස සලකන ලදි. ඉහත විචල්‍යයන් දෙක පදනම් කර ගනිමින් පර්යේෂකයා විසින් උපන්‍යාස දෙකක් ගොඩනඟන ලදි. පාරිභෝගික අංශ පාඩු ලැබිමට සමුපකාර සමිති කළමනාකාරිත්වය බලපානු ලබයි හා පුද්ගල සාධක සහ සමිතියේ පාරිභෝගික අංශයේ අලාභයන් අතර ධනාත්මක සම්බන්ධයක් ඇත යන්න එම උපන්‍යාස දෙක වේ. මෙම පර්යේෂණය ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් මත සිදුකරනු ලැබූ ගවේෂණයකි. මෙම අධ්‍යයනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි විවිධ සේවා සමුපකාර සමිති 22 ක ප්‍රමාණය සංගහණය ලෙස තෝරා ගන්නා ලදි. ප්‍රශ්ණාවලියක් මත පදනම්ව ප්‍රාථමික දත්ත ඒකරාශි කර ගන්නා ලදි. ද්විතීයික

දත්ත ක්ෂේත්‍රයට අදාල පොත්පත්,පුවත්පත්,සඟරා ලිපි ආදිය මත පදනම්ව එකතු කර ගන්නා ලදි. ඉහත ලියාපදිංචි සමුපකාර සමිති 22 අතරින් නියැදිය සඳහා විවිධ සේවා සමුපකාර සමිති 07 ක් අරමුණු සහගත නියැදිමෙන් තෝරා ගන්නා ලදි. පර්යේෂකයා විසින් ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදි. දත්ත ඉදිරිපත් කිරිම සඳහා වගු, ස්ථම්භ ප්‍රස්ථාර, තීරු ප්‍රස්ථාර සහ වට ප්‍රස්ථාර යොදා ගන්නා ලදි. එමෙන්ම මෙම පර්යේෂණයේදී ප්‍රමාණාත්මකව දත්ත විශ්ලේෂණය සිදු කර ඇත. ඒ සඳහා මාතය මධ්‍යස්ථය, මධ්‍යයනය, සහම්බන්ධතාවය හා ප්‍රතිශත අගයන් භාවිතා කරනු ලැබිණි. තවදුරටත් ප්‍රශ්නාවලියේ විශ්වාසවන්තභාවය පරීක්ෂා කිරිම සඳහා සහ දත්ත විශ්ලේෂණයට දත්ත විශලේෂණ මෘදුකාංගය භාවිතා කරන ලදි. දත්ත විශ්ලේෂණයේදී පලමුව නියැදියේ ජනවිකාස සාධක වල හැසිරිම විශ්ලේෂණය කරන ලදි. නියැදියේ බහුතරය ගැහැණු අයවලුන් වන අතර එය සමස්ථයෙන් 64.4 % ක ප්‍රතිශතයක් පෙන්වන බව අනාවරණය විය. නියැදිය තුල 60.0% විවාහක අයවන අතර, 40% අවිවාහක වේ. නියැදිය වයස් කාණ්ඩ හතරක් යටතේ වර්ගිකරණය කරන ලද අතර,වයස අවුරුදු 20-30 අතර, 8.9% ක් ද වයස අවුරුදු 31-40 අතර, 46.7% ද වයස අවුරුදු 41-50 අතර. 35.6% පිරිසද අවුරුදු 51 ට වැඩි පිරිස 8.9 % ද ලෙස අනාවරණය විය. සේවකයන්ගේ සේවා කාලය ගත් කල නියැදියෙන් 22.2% ක් වසර 10 ට වඩා අඩු සේවා කාලයක් සම්පුර්ණ කර ඇත. නියැදියෙන් බහුතරයක් සිටින්නේ 37.9% වන වසර 20 ට වඩා අඩු සේවා කාලයක් පවතින අයවළුන්ය. සේවා මට්ටම සලකා බලන විට නියැදියෙන් 40% ක් පහල කලමනාකරණය ද, 37.8% ක් මධ්‍ය කළමනාකරණය ද නියෝජනය කරනු ලබයි. මාසික ආදායම සලකා බැලූ කල බහුතරයක් සිටින්නේ රු.25,000/- -රු.35,000/- අතර වැටුප්ලාභීන්ය. එය සමස්ථ නියැදියෙන් 46.7% කි. මෙම නියැදියට අනුව තනිව ජීවත්වන සේවකයින් නොමැත. පවුලේ සාමාජිකයින් තිදෙනෙක් සිටින සේවක සංඛ්‍යාව නියැදියෙන් 55.7 % ක් වේ. උපන්‍යාස පරීක්ෂා කිරිමට ප්‍රථම පර්යේෂකයා විසින් දත්තවල විශ්වසානීය බව පරික්ෂා කරන ලදි. එය Cronbach's alpha සංගුණනය මඟින් සිදු කරන ලදි. උපන්‍යාස සියල්ලේම ප්‍රශ්නවලට ලැබුණ සංගුණිත සියල්ල 0.7 වඩා ඉහල අගයක් ගන්නා ලදි. ඒ අනුව දත්තවල විශ්වාසනීය බව තහවුරු විය. විචල්‍යයන් අතර සම්බන්ධය පියර්සන් සහසම්බන්ධතා විශ්ලේෂණය මඟින් සිදු කරන ලදි. සහසම්බන්ධතා විශ්ලේෂණය මඟින් ස්වායත්ත විචල්‍යය පරායත්ත විචල්‍යය සමඟ සම්බන්ධතාවයක් පවතින බව සාධනය විය. ඒ අනුව සමිතියේ කළමනාකරණ තීරණ පාරිභෝගික අංශ අලාභ ලැබිමට ප්‍රමාණවත් සම්බන්ධයක් දක්වන ලදි. පර්යේෂණයේ නිගමනයන් සලකා බැලිමේදී පහත ගම්‍යවිම් හඳුනා ගන්නා ලදි. විවිධ සේවා සමිතිවල සේවකයින්ගෙන් 65% ක් කාන්තාවන් බවත්, විවිධ සේවා සමිතිවල අධ්‍යක්ෂක මණ්ඩල නියෝජිතයිනගෙන් 95% පිරිමින් බවත්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්වන ආකාරය අනුව වෘත්තිය සුදුසුකම් ඇති කළමනාකරණ දැනුම සහිත සාමාජිකයින් පත් නොවන බවත් ගම්‍යය විය. තවදුරටත්, විවිධ සේවා සමිතිවල

වෙළඳ ඒකකවල කළමනාකරුවන් 85% කාන්තාවන් වේ. වෙළඳ ඒකක විවෘත වේලාව රජයේ කාර්යාල වේලාව බවට පත්ව ඇත. ග්‍රාමීය ප්‍රදේශවල පාරිභොගිකයින් ගැවසෙන වේලාවන් හි සමුපකාර ප්‍රාදේශිකය වසා ඇත. එමෙන්ම, වෙළඳ ඒකකවල මුළු විකුණුම් වලින් 60% ක් ඉක්මවා විකුණුම් කර ඇත්තේ ලාභ පරතරය අඩු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වන සහල්, පිටි, සිනි හා පරිප්පු වේ. එය ලාභය අඩුවීමටත් මෙහෙයුම් පිරිවැය ඉහල යාමටත් බලපා ඇත. අනෙක් අතට කළමනාකරණ මණ්ඩලයට වෙළඳාම පිළිබඳ හා වෙළඳපොල හැසිරීම පිළිබඳ අවබෝධයක් නොමැති බව හඳුනා ගන්නා ලදි. පර්යේෂණයේ නිර්දේශ ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මනාව පුහුණු කිරීම, ඔවුන් හට විශිෂ්ඨ කළමනාකරණ උපායමාර්ග, මූල්‍ය වෙළඳපල දැනුම, සමුපකාර කළමනාකරණ ක්‍රම පිළිබඳ දැනුම හා ක්ෂෙත්‍රයේ ප්‍රායෝගික දැනුම ලබාදිය යුතුය. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට F-28 මෙහෙයුම් වාර්තාව විශ්ලේෂණය කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදිය යුතු බව ද පර්යේෂකයින් යෝජනා කරයි. අධ්‍යයනයේ සීමාවන් ලෙස මධ්‍යම පලාතේ එක් දිස්ත්‍රික්කයක් මත පදනම්වීම දැක්විය හැක. ඉදිරි පර්යේෂණ සඳහා නියැදිය වැඩිකර පළාත් කිහිපයක මෙම අධ්‍යයනය සිදු කිරීමට පර්යේෂකයින් නිර්දේශ කරයි.

**මූලපද:** *කළමනාකරණ තීරණ ,පාරිභෝගික අංශය,අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, කළමනාකරුවන්*

## The Impact of Co-operative Marketing Mix Practices on customer Loyalty in co-opacities of central Province in Sri Lanka

S.H.J Dissanayake[1]
N.B Hapuarachchi[2]

*1. Co-operative development Officer, Co-op development, Central Province.*
*2. Senior Lecture, National Institute of Co- operative development, Polgolla.*

The aim of this study is to identify the impact of Co-operative marketing mix practices on customer loyalty in co-op cities of central Province Sri Lanka. At present, most of the co-operative outlets are engaged in marketing but has suffered some setback compared with the private sector. The main objective of the study is to find the impact of co-operative marketing mix practices on customer loyalty in co-op cities in central province. The population of the study have been selected out of the population which demonstrates the 100,000 active customers connected with the co-op cities. Further, 400 customers were selected as the study sample. Data collection done through a questionnaire. Researcher developed a deductive type quantitative study to achieve the research objective. There were seven independent variables which demonstrated 7Ps of marketing mix. Customer loyalty becomes the dependent variable. Moreover, seven hypothesis statements had been constructed to identify the relationship between the independent and the dependent variables. After the analysis it has been identified that all the correlation values become positive except one variable. Independent variable of place had a weak positive and a significance relationship towards the dependent variable. As per the results of the data analysis, the conceptual model fit to define the situation. The regression analysis describes the model fitness of the study. Thus, excluding, $H_4$ all the other hypothesis statements were accepted. However, co-op cities must establish marketing mix practices to ensure the customer loyalty. In conclusion all the six independent variables are impacted to the customer loyalty, except the promotion. Moreover, significant of the study highlights for policy making discussion making in the co-op sector. In future, researcher recommend to expand the sample.

**Key Words**: *Product, Price, Place, Promotion, Process, Physical Evidence, People, Consumer Loyalty.*

National Institute of Co-operative Development
Polgolla - Sri Lanka
Office: 0812498679 / 80
Fax : 0812499741